පුනරීක්ෂණ අභ්‍යාස (2)

(10) දරුවකුගේ පස් වන උපන් දිනය 2002 - 08 - 26 දින වේ. එදින ඔහුගේ ස්කන්ධය 20 kg 700 g කි.

(i) ඔහුගේ උපන් දිනය කවරදා ද?

(ii) 8 වන උපන් දිනය වන විට ඔහුගේ ස්කන්ධය 30 kg 600 g ක් විය. වසර 3ක් තුළ ඔහුගේ ස්කන්ධය කොපමණ වැඩි වී තිබේ ද?

(iii) 2012 - 03 - 25 දිනට ඔහුගේ වයස සොයන්න.

(iv) 2012 - 03 - 25 දින වන විට 5 වන උපන් දිනයේ දී, තිබූ ස්කන්ධය 12 kg 800 g කින් වැඩි වී තිබේ නම්, එදිනට ඔහුගේ ස්කන්ධය සොයන්න.

(11) (a) සංඛ්‍යා රේඛාව භාවිත කර, පහත දැක්වෙන එක් එක් නිඛිල යුගලයේ ඓක්‍යය සොයන්න.

(i) $(-6)+(-4)$ (ii) $(-5)+(+5)$ (iii) $(+8)+(-9)$

(b) පහත දැක්වෙන එක් එක් කෝණයෙහි විශාලත්වය කෝණමානයෙන් මැන ලියන්න.



(i) (ii) (iii)

(c) කෝණමානය සහ සරල දාරය භාවිත කර පහත සඳහන් එක් එක් කෝණය අඳින්න.

(i) $A\hat{B}C = 65^\circ$ (ii) $P\hat{Q}R = 130^\circ$ (iii) $M\hat{N}R = 145^\circ$